# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2015

**මහා භාණ්ඩාගාරය**

**කොළඹ - 01**

දුරකථන : 011 - 2484757

ෆැක්ස් : 011 - 2430270

ඊ-මේල් : dgms@msd.treasury.gov.lk

# දැක්ම

**රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම**

# මෙහෙවර

**රාජ්‍ය සේවය විශිෂ්ට මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රශස්ත තනතුරු ප්‍රමාණ රාජ්‍ය ආයතන වෙත ලබාදීම**

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව රාජ්‍ය අංශයේ විවිධ ක්ෂේත්‍රයන්හි ඇතිවන මානව සම්පත් අවශ්‍යතාවයන්ට හා සංවර්ධන ඉලක්කයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශය තුළ ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීමේ අභියෝගාත්මක කාර්යයට 2015 වර්ෂයේ දී සාර්ථකව මුහුණ දීමට හැකි විය.

නව ජවයකින් ඉදිරියට යන සංවර්ධන ක්‍රියාවලිය තුළ රජය විසින් සැලසුම් කර ඇති සීඝ්‍ර ආර්ථික හා සමාජ අභිවෘද්ධි ඉලක්ක ළඟා කර ගැනීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම ලෙස සලසා දෙමින් සංවර්ධන ක්‍රියාවලිය පහසු කිරීමටත් මහජනතාව තෘප්තිමත් වන අයුරින් නිවැරදි, කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් ලබා දීමටත් හැකි වන පරිදි රාජ්‍ය අංශයේ මානව සම්පත වඩාත් යෝග්‍ය හා ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයයි. ඒ අනුව 2015 වර්ෂය, යථෝක්ත කාර්යභාරය සාර්ථක කර ගැනීම අරභයා සාධනීය දායකත්වයක් ලබාදීමට හැකි වූ වසරක් බව ප්‍රකාශ කරනුයේ හදපිරි සතුටිනි.

අප දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම උදෙසා නිසි මග පෙන්වීම හා සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මැතිතුමාට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ට සහ සහෝදර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මාගේ හදපිරි ප්‍රණාමය පුද කරමි. අවශ්‍ය අවස්ථාවන්හි දී නිසි උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දෙමින් සහයෝගය දැක්වූ ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිලධාරීන්ට ද වැදගත් කාර්යයක් ඉටු කරමින් සහයෝගය ලබා දුන් මුදල් කොමිෂන් සභාවේ සහ සියලුම රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්ට ද මාගේ ප්‍රණාමය පුද කරමි. තවද, ඇඩි කැපවීමෙන්, කණ්ඩායම් හැඟීමෙන් හා සහයෝගයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කළ කාර්යමණ්ඩලයට ද ප්‍රශංසාව පිරිනමමි.

**එන්. ගොඩකන්ද**

**අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන


| | පිටුව |
|---|---|
| 1. හැඳින්වීම | 1 - 2 |
| 2. කාර්යමණ්ඩල කළමනාකරණය | 3 - 6 |
| 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය | 7 |
| 4. පර්යේෂණ, නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා කමිටු නියෝජනය | 8 - 9 |
| 5. ආයතන අංශය | 10 - 17 |
| 6. මූල්‍ය අංශය | 18 - 19 |
| 7. උපලේඛනය | |

# 1. හැඳින්වීම

## 1.1 පසුබිම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ 1999 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරනු ලැබීය. එතැන් සිට ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමින් රාජ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ආයතනික මට්ටමින් අවශ්‍ය වන ප්‍රශස්ත කාර්යමණ්ඩලය හඳුනා ගැනීමත්, එසේ හඳුනා ගන්නා තනතුරුවලට අදාළ වැටුප් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් /උසස් කිරීම් පරිපාටි සඳහා අනුමැතිය ලබා දීම ආදී කටයුතු මගින් රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සපයා ඇත. මෙහිදී රටේ මූල්‍ය තත්ත්වය, සංවර්ධන විභවතාවය, කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ඇති කිරීම වැනි අංශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය විය. මේ සඳහා කාලීන අවශ්‍යතා පරිදි අදාළ අනෙකුත් ආයතන සමඟ ද මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කාර්යමණ්ඩල සමාලෝචන තුළින් රාජ්‍ය අංශයට අවශ්‍ය ප්‍රශස්ත මානව සම්පත පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත.

## 1.2 පරමාර්ථ

රාජ්‍ය අංශයෙහි මානව සම්පත් කළමනාකරණය සඳහා පරමාර්ථ කිහිපයක් යටතේ මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

i. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය
ii. ජාතික වැටුප් ප්‍රතිපත්තීන්ට අනුකූලව වැටුප් හා දීමනා තීරණය කිරීම
iii. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳව අධ්‍යයන සිදු කිරීම

## 1.3 කාර්යභාරය

(i) සේවක සංඛ්‍යා අවශ්‍යතාවයන් පිළිබඳ සම්මත මිනුම් සහ ප්‍රමිතීන් ගොඩනගා ගැනීම
(ii) රාජ්‍ය අංශයේ වැටුප් සහ ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම, සුභ සාධක යෝජනා ක්‍රම සහ වෙනත් එවැනි පාරිශ්‍රමික සංවිහිතීන් කළමනාකරණය
(iii) රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා සඵලතාවය සහතික කිරීමේ අදහස පෙරදැරිව ආයතනික හා කාර්යමණ්ඩල සමාලෝචන පැවැත්වීම, ක්‍රම පද්ධති වැඩි දියුණු කිරීම, සංවිධාන ව්‍යුහයන් ගොඩනැඟීම හා ශක්තිමත් කිරීම
(iv) රාජ්‍ය අංශයෙහි ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳ අන්වේෂණය පවත්වා ගැනීම
(v) මෙහෙවර, පරමාර්ථ, ක්‍රම පද්ධති, පරිපාටි සහ කාර්යමණ්ඩල සම්පාදනය පිළිබඳ ආයතනික සමාලෝචන පවත්වා අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
(vi) රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා නිසි ප්‍රමාණයට සැකසීම අරමුණු කොට ගෙන රාජ්‍ය අංශයේ ආයතනවල ද්විත්වකාරක කාර්යයන් හඳුනා ගැනීම
(vii) අතිරික්ත සේවක සංඛ්‍යාවන් හඳුනා ගැනීම, ඔවුන් නැවත සුදුසු පරිදි යෙදවීම සහ සේවාහරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

(viii) භෞතික පරිසරය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන්, යාන්ත්‍රීකරණය/පරිගණකගතකරණය සහ සේවා බාහිරකරණය සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම

(ix) සංවර්ධන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සේවා ව්‍යවස්ථා, සේවා කොන්දේසි සමාලෝචනය පිළිබඳ අධ්‍යයනයන්හි යෙදීම සහ යෝජනා ඉදිරිපත් කිරීම

(x) රාජ්‍ය අංශය තුළ විශ්‍රාමික නිලධාරීන් යළි සේවයේ යෙදවීම, උපදේශකයින් යොදවා ගැනීම පිළිබඳ යෝජනා පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම

(xi) රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙහි කාර්යමණ්ඩල පිළිබඳ තොරතුරු පද්ධති පවත්වා ගැනීම

(xii) බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, නිපුණතා සංවර්ධන පුහුණුව සහ අනුප්‍රාප්තිය සැලසුම් කිරීම පිළිබඳ අධ්‍යයනයන් සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා අදාළ බලධාරීන්ට සහාය වීම

(xiii) ජාතික වැටුප් කොමිෂන් සභාවට/අග්‍රස්ථ ආයතනයන්ට සේවා සැපයීම

# 2. කාර්යමණ්ඩල කළමනාකරණය

## 2.1 හැඳින්වීම

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේ දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- තනතුරු අනුමත කිරීම
- පුරප්පාඩු පිරවීම අනුමත කිරීම
- තනතුරු යටපත් කිරීම
- තනතුරු නාම සංශෝධනය කිරීම
- රාජ්‍ය ව්‍යාපෘතීන් සඳහා කාර්යමණ්ඩල අනුමත කිරීම හා වැටුප් තීරණය කිරීම
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි අනුමත කිරීම

රාජ්‍ය අංශය වෙත පැවරී ඇති කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගත යුතුවේ. ඒ අනුව රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් හා රජයේ ව්‍යාපෘතීන්හි කාලීන මානව සම්පත් අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගෙන ආයතන තුළ ප්‍රශස්ත තනතුරු සංඛ්‍යාවක් පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2015 වර්ෂය තුළ ද සිය කාර්යභාරය මැනවින් ඉටු කරන ලදී.

## 2.2 පරිපාලන මට්ටම අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

රාජ්‍ය අංශයේ සමස්ත සේවා නියුක්තිය 2015.12.31 දිනට 1,316,863ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, ආරක්ෂක අංශ, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ සමස්ත කාර්යමණ්ඩල සංයුතිය පහත 2.1 වගුව මඟින් දැක්වේ.

**වගුව - 2.1 රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2015**

| පරිපාලන මට්ටම | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික | 858,680 | 722,950 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 394,812 | 374,330 |
| **සමස්ත රාජ්‍ය සේවය** | **1,253,492** | **1,097,280** |
| රාජ්‍ය ව්‍යවසායන් හා රාජ්‍ය බැංකු | 244,800 | 219,583 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,498,292** | **1,316,863** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.3 රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය - 2015

මහජනතාව වෙත කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් හා සංවර්ධන ප්‍රමුඛතාවයන් මත ඉලක්කගත ආර්ථික සංවර්ධන කටයුතු පහසු කිරීම උදෙසා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළත් රාජ්‍ය අංශය සඳහා 2015 වසර තුළ දී ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව රාජ්‍ය සේවයේ තනතුරු ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික වශයෙන් මට්ටම් හතරකින් සමන්විත වේ. ඒ අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා වර්ගීකරණය 2.2 වගුව මගින් දැක්වේ.

**වගුව - 2.2 සේවා මට්ටම් අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා වර්ගීකරණය - 2015**

| පරිපාලන මට්ටම | සේවා මට්ටම (තනතු) | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ | තෘතීය | ද්විතීය | ප්‍රාථමික | |
| ජාතික (රාජ්‍ය ව්‍යවසායන් හා රාජ්‍ය බැංකු ද ඇතුළුව) | 30,720 | 25,523 | 691,792 | 194,498 | 942,533 |
| පළාත් සභා | 11,270 | 14,676 | 242,638 | 58,245 | 326,829 |
| පළාත් පාලන ආයතන | 908 | 814 | 12,868 | 32,911 | 47,501 |
| **මුළු එකතුව** | **42,898** | **41,013** | **947,298** | **285,654** | **1,316,863** |
| **ප්‍රතිශතය ( % )** | **3** | **3** | **72** | **22** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ මට්ටමේ වගකීම් දරන ඉංජිනේරු, අධිකරණ, නීති, වෛද්‍ය නිලධාරීන් ද ඇතුළත් අනෙකුත් විධායක නිලධාරීන් ජ්‍යෙෂ්ඨ මට්ටම නියෝජනය කරමින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට තුනක (3%) දායකත්වයක් හිමිකර ගනී. අධීක්ෂණ කාර්යභාරය පැවරී ඇති විධායක මට්ටමට සහාය වන පරිපාලන, නියාමන සහ බලාත්මක යන කාර්යයන්හි නියුතු නිලධාරීන් හා භාෂා පරිවර්තක නිලධාරීන් ද තෘතීය මට්ටම වශයෙන් සමස්ත රාජ්‍ය අංශයට සියයට තුනක (3%) දායකත්වයක් සපයනු ලබයි.

සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර, හෙද නිලධාරීන්, ගුරුවරුන්, ත්‍රිවිධ හමුදා සොල්දාදුවන්, පොලිස් කොස්තාපල් වැනි නිලධාරීන්ගෙන් සමන්විත ද්විතීය මට්ටම රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තියෙන් සියයට හැත්තෑ දෙකක (72%) ප්‍රතිශතයක් නියෝජනය කරයි. අධ්‍යාපන හා සෞඛ්‍ය වැනි සේවා දීප ව්‍යාප්තව සැපයීම සඳහා ගුරුවරුන් හා හෙද නිලධාරීන් ද රටෙහි ග්‍රාමීය කේන්ද්‍රික සේවා සැපයීම හා ග්‍රාමීය සංවර්ධන කටයුතු වෙනුවෙන් ව්‍යාප්ති නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් ද බහුල වශයෙන් සේවා නියුක්ත කර ඇති ආකාරය මින් පිළිබිඹු වේ. සමස්ත රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවෙන් සියයට විසිදෙකක් (22%) නියෝජනය කරන රියදුරු, කාර්යාල සහායක වැනි සේවක කාණ්ඩයන් ප්‍රාථමික මට්ටමේ සහාය සේවා සපයනු ලබයි.

### 2.3.1 තනතුරු ඇති කිරීම - 2015

තනතුරු අනුමත කිරීමේ දී අදාළ ආයතනවලට පැවරී ඇති කාර්යභාරය, රටේ මූල්‍ය ශක්‍යතාවය මෙන්ම තනතුරු ඇති කිරීමේ කාලීන අවශ්‍යතාවය ද සැලකිල්ලට ගන්නා ලදී. රාජ්‍ය අංශය සඳහා තනතුරු ඇති කිරීම පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් මට්ටමින් කරන ලද , 2012 - 2015 අතර සංසන්දනාත්මක වර්ගීකරණය පහත 2.3 වගුව මගින් දක්වා ඇත.

වගුව - 2.3 **තනතුරු ඇති කිරීම (2012 - 2015)**

| ආයතනය | 2012 | | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|---|
| | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | 38,368 | 78 | 15,315 | 77 | 5,326 | 50 | 11,179 | 70 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 8,572 | 17 | 3,093 | 16 | 3,926 | 37 | 3,131 | 20 |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | 2,217 | 5 | 1,330 | 7 | 1,422 | 13 | 1,557 | 10 |
| **එකතුව** | **49,157** | **100** | **19,738** | **100** | **10,674** | **100** | **15,867** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ඒ අනුව 2015 වර්ෂයේ දී අනුමත තනතුරු අතරින් සියයට හැත්තෑවක් (70%) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වේ.

### 2.3.2 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම හා තනතුරු යටපත් කිරීම

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයේ සහ පළාත් පාලන ආයතන ඇතුළුව පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල ඇතිවන පුරප්පාඩු පිරවීම අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්/ පළාත් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය මත සිදු කෙරේ.

2015 වර්ෂය තුළ සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයන්හි දී අමාත්‍යාංශයන්හි විෂයයන් සංශෝධනය වීමට සමගාමීව කාර්යමණ්ඩලය ද ගැළපුම් කරන ලදී. ඒ අනුව අනුමතව පැවති තනතුරු එක් එක් අමාත්‍යාංශයේ සේවා අවශ්‍යතාවය මත යාවත්කාලීන කර අනුමත කරන ලදි.

### 2.3.3 ව්‍යාපෘති කාර්යමණ්ඩල සහ වැටුප් කළමනාකරණය

ජාතික හා පළාත් මට්ටමින් රට තුළ ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති, සැලසුම් ගත කාල වකවානු තුළ නිම කිරීමට අවශ්‍ය වන කාර්යමණ්ඩල සඳහා අනුමැතිය ලබා දීම හා එම තනතුරුවලට අදාළ වැටුප් තීරණය කිරීම 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි විධිවිධාන අනුව සිදු කරන ලදී. ඒ අනුව 2015 වසර තුළදී ද මෙම කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉහළ සහයෝගයක් ලබා දෙන ලදී.

වගුව - 2.4 ව්‍යාපෘති කාර්යමණ්ඩල අනුමත කිරීම - 2015

| අනු අංකය | ව්‍යාපෘතිය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ඉරණමඩු ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 16 |
| 2. | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය | 04 |
| 3. | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 08 |
| 4. | ඒඩ්ස්, ක්ෂය රෝග හා මැලේරියා මර්දන ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය | 397 |
| 5. | කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය | 02 |
| 6. | සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් නංවාලීමේ ව්‍යාපෘතිය - අදියර III | 01 |
| 7. | ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 90 |
| 8. | ඩෙංගු එන්නත් සායනිකව අත්හදා බැලීම සඳහා වූ පවුල් අධ්‍යයන ව්යාපෘතිය | 22 |
| 9. | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය | 11 |
| 10. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | 71 |
| 11. | දේශීය ආර්ථික සංවර්ධනය සඳහා පාලන ව්‍යාපෘතිය | 10 |
| 12. | දොම්පේ සනීපාරක්ෂක කසළ බිම් ව්‍යාපෘතිය | 01 |
| 13. | ධීවර වරාය හා නැංගුරම්පොළ සංවර්ධන වැඩසටහන | 06 |
| 14. | නැගී එන කලාපයන්හී මූලික සමාජ සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 01 |
| 15. | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන | 40 |
| 16. | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - අදියර III | 260 |
| 17. | පුර නැගුම ව්‍යාපෘතිය | 05 |
| 18. | පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය | 39 |
| 19. | බදුල්ල - චෙන්කලඩි මාර්ග ව්‍යාපෘතිය | 20 |
| 20. | මත්ස්‍ය අපනයන සඳහා යුරෝපීය සංගමය විසින් පනවා ඇති තහනම කඩිනමින් ඉවත්කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය | 83 |
| 21. | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන | 93 |
| 22. | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් | 215 |
| 23. | මොරගහ කන්ද කළුගඟ ව්‍යාපෘතිය | 284 |
| 24. | මොරාන ජලාශ ව්‍යාපෘතිය | 02 |
| 25. | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය | 186 |
| 26. | යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය | 06 |
| 27. | යුධ ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය | 14 |
| 28. | විසල් කුරුණෑගල ජලසම්පාදන හා ජලාපවාහන ව්‍යාපෘතිය | 01 |
| 29. | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | 350 |
| 30. | ශ්‍රී ලංකා පරමාණුක බල ශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 02 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය අතර රාජ්‍ය අංශයේ වැටුප් හා ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම හා වෙනත් පාරිශ්‍රමික කළමනාකරණය ද ප්‍රමුඛ වේ. මෙම කාර්යයේ දී ජාතික වැටුප් කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව යන ආයතනවල නිරීක්ෂණ සහ නිර්දේශ ද සැලකිල්ලට ගෙන අදාළ තීරණ ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. එසේම වැටුප් හා පාරිශ්‍රමික පිළිබඳ ප්‍රායෝගික ගැටලු පැන නගින අවස්ථාවල දී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය උපදෙස් හා පැහැදිලි කිරීම් ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. තවද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව 2015 වසරේ දී ද රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු මෙන්ම වැටුප් හා දීමනා තීරණය කර ඇත. ඒ අනුව 2015 වසර තුළ දී පහත සඳහන් චක්‍රලේඛ නිකුත් කරන ලදී.

### කළමනාකරණ සේවා චක්‍රලේඛ - 2015

| | | |
|---|---|---|
| 01. | 2015.09.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2015 | 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවයේ නියුතු කොන්ත්‍රාත් නිලධරයන් සඳහා අන්තර් දීමනා ගෙවීම |
| 02. | 2015.12.09 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2015 | රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්යමණ්ඩලයට 2015 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම. |

# 4. පර්යේෂණ, නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා කමිටු නියෝජනය

## 4.1 පර්යේෂණ කටයුතු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන් අතරින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවන්ට අදාළ වූ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රශස්ත කාර්යමණ්ඩලයක් පවත්වා ගැනීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳ සම්මත මිනුම් හා ප්‍රමිතීන් ගොඩනගා ගැනීම, වැටුප් හා දීමනා සහ අනෙකුත් පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා තීරණ ලබා දීම, රටෙහි සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසි සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදු කිරීම සහ ඊට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි අවස්ථාවල දී දෙපාර්තමේන්තුවට අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට සිදු වේ.

එකී කාර්යයන් ඉහළ ප්‍රමිතියකින් හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ අංශයක් ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඵලදායීව ඉටු කිරීමේ දී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම, එම තොරතුරු විශ්ලේෂණය කර නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කිරීම පර්යේෂණ අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වේ. මෙහිදී අවශ්‍ය විමර්ශනයන්/අධ්‍යයනයන් සඳහා පර්යේෂණ අංශයේ නිලධාරීන් අදාළ ආයතන වෙත පෞද්ගලිකවම යොමු කර තොරතුරු රැස් කිරීම ද සිදු කෙරේ.

## 4.2 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

රාජ්‍ය අංශයේ ආයතන කටයුතු, වැටුප් හා දීමනා තීරණය කිරීම ආදී මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි. 2015 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ ඒවා අයත් වන විෂය ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු 4.1 වගුව මගින් දක්වා ඇත.

වගුව - 4.1 **අමාත්‍ය මණ්ඩල සංදේශ නිරීක්ෂණ වර්ගීකරණය - 2015**

| අනු අංකය | ක්ෂේත්‍රය/විෂයය | සංදේශ ගණන |
|---|---|---|
| 1. | පත් කිරීම්/ බඳවා ගැනීම් | 217 |
| 2. | සේවය දීර්ඝ කිරීම් | 47 |
| 3. | තනතුරු ඇති කිරීම් | 18 |
| 4. | පාරිශ්‍රමික | 47 |
| 5. | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි | 57 |
| 6. | විනය කටයුතු | 13 |
| 7. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 49 |
| 8. | අනෙකුත් | 89 |
| **එකතුව** | | **537** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2015 වසර තුළ නිරීක්ෂණ ලබා දෙන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අතරින් තනතුරු සඳහා පත් කිරීම, සේවය දීර්ඝ කිරීම සහ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට අමතරව නිතිපතා පැවැත්වෙන ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීම් සඳහා ද දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ලබා දෙන ලදී.

වසර 2005 - 2015 දක්වා දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු 4.2 වගුව මගින් දක්වා ඇත.

වගුව - 4.2 **අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම**

| වර්ෂය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 605 | 820 | 780 | 750 | 1272 | 1598 | 1019 | 399 | 499 | 449 | 537 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 4.3 කමිටු නියෝජනය, සම්බන්ධීකරණ කටයුතු හා සන්නිවේදනය

සංවර්ධන හා ආයතන කටයුතු සම්බන්ධ පහත සඳහන් සමුළු හා සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම් නියෝජනය කරමින් ක්‍රියාකාරී ලෙස දායකත්වය සපයා ඇත.

- ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත්ව පත් කර ඇති නිලධාරි කමිටු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)
- දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමුළු
- පළාත් ප්‍රධාන ලේකම් සමුළු
- ජාතික වැටුප් කොමිෂන් සභා සාකච්ඡා
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන සහ නියාමන (Steering) කමිටු
- ව්‍යවස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම්
- ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු

තවද, විවිධ ආයතනයන්හි ඉල්ලීම් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් වශයෙන්ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වී ඇත. එසේම, රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල ගැටලු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමග නිරන්තර සාකච්ඡා පවත්වනු ලැබේ. මේ අයුරින්, රාජ්‍ය අංශයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරනු වස් ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරනු ලැබ ඇත.

# 5. ආයතන අංශය

## 5.1 හැඳින්වීම

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රැකියා තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තුවේ භෞතික පරිසරය, රැකියා තෘප්තිය වර්ධනය කරලීමට සමත් මිත්‍රශීලී කාර්යාල පරිසරයක් ලෙස සකස් කර දීමටත්, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී සෙසු කාර්යමණ්ඩලයට අවශ්‍ය සහයෝගය ලබා දීමටත් ආයතන අංශය කටයුතු කරන ලදී.

2015 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සතුව තිබූ මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිත කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගැනීමට සමත් විය. 2015.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යමණ්ඩල තොරතුරු 5.1 වගුව මගින් දැක්වේ.

**වගුව - 5.1** **2015.12.31 දිනට කාර්යමණ්ඩල තොරතුරු**

| අනු අංකය | තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 |
| 2. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 01 |
| 3. | අධ්‍යක්ෂ | 07 | 03 | 04 |
| 4. | සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 10 | 08 | 02 |
| 5. | ගණකාධිකාරි | 01 | 01 | 00 |
| 6. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 | 00 | 01 |
| 7. | පරිපාලන නිලධාරි | 01 | 01 | 00 |
| 8. | භාෂා පරිවර්තක | 01 | 01 | 00 |
| 9. | පර්යේෂණ සහකාර | 07 | 03 | 04 |
| 10. | සංවර්ධන නිලධාරි | 02 | 03 | -01 |
| 11. | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | 00 |
| 12. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 31 | 28 | 03 |
| 13. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 03 | 00 | 03 |
| 14. | ලේඛන සහකාර | 01 | 00 | 01 |
| 15. | රියදුරු | 07 | 07 | 00 |
| 16. | කාර්යාල කාර්ය සහායක | 07 | 07 | 00 |
| | **එකතුව** | **82** | **64** | **18** |

2015.12.31 දිනට දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්යමණ්ඩලය පහත ලේඛනය - 01 මගින් දක්වා ඇත.

**ලේඛනය - 01 2015.12.31 දිනට කාර්යමණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 2. | ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය | අධ්‍යක්ෂ |
| 3. | එස්.එච් ඩී. කළුතන්ත්‍රී මිය | අධ්‍යක්ෂ |
| 4. | එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා | අධ්‍යක්ෂ |
| 5. | පී. චාමිකා මධුවන්ති මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 6. | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 7. | ඩබ්.එච්.ජී.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 8. | එම්.ඩී. අබේගුණවර්ධන මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 9. | ඩබ්.ඩී. සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 10. | එස්.ඒ.එච්. සමරසිංහ මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 11. | පී.එල්.එම්. චතුරංග මයා | සහකාර අධ්‍යක්ෂ |
| 12. | එම්.ඒ.එස්. මධුශංක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 13. | කේ.ඩී.අයි.එස්.කේ. සිරිවර්ධන මිය | ගණකාධිකාරි |
| 14. | පී.කේ. සරත්චන්ද්‍ර මයා | පරිපාලන නිලධාරි |
| 15. | පී.ඩී.ඩී. සමරසේකර මිය | භාෂා පරිවර්තක |
| 16. | එම්.එම්.ඒ.එන්. මල්පෝරු මිය | පර්යේෂණ සහකාර |
| 17. | එස්.එම්.එම්.ඩී. සමරවීර මයා | පර්යේෂණ සහකාර |
| 18. | බී.එම්. සරත් මයා | පර්යේෂණ සහකාර |
| 19. | එච්.එස්.ඒ. හේනෙපොල මිය | සංවර්ධන නිලධාරි |
| 20. | එස්.එස්. ඇල්පිටියගේ මිය | සංවර්ධන නිලධාරි |
| 21. | ඊ.එන්. රණසිංහ මිය | සංවර්ධන නිලධාරි |
| 22. | එම්.පී.එස්. සල්ගාදු මයා | තොරතුරු තාක්ෂණ සහකාර |
| 23. | එම්.ඩී.පී.එස්.ආර්. පතිරණ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 24. | ඒ.එම්.එස්.එස්.කේ. අරම්පත් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 25. | කේ.එස්.එස්. ආර්. සෙනෙවිරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 26. | එච්.එල්. මංගලිකා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 27. | ඒ.එම්.එන්. ශ්‍යාමලී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 28. | කේ.අයි. පෙරේරා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 29. | ඩබ්.එම්. චමින්ද කුසුම් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 30. | එස්.එස්. බියන්විල මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 31. | ටී. ශිරාණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 32. | එස්.පී. සෙල්ලාහැන්නදි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 33. | ඒ.කේ. ඩී. ප්‍රියංකා සෝමසිරි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 34. | ජේ.ඒ. නේෂා දේදුණු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 35. | එච්.බී.සී.එම්. දසනායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 36. | ඩබ්.ජී.ඒ. මේකලා ජීවනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 37. | ඒ.අයි.එල්. සිරිසේන මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 38. | ජී.එන්.එච්. අබයවර්ධන මෙනෙවිය | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 39. | එල්.පී. විතානගේ මයා | රාජ්‍ය කළමණාකරණ සහකාර |
| 40. | අයි.කේ.ඒ.පී. කිත්සිරි මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |

| | | |
|---|---|---|
| 41. | එම්.ඩී.ආර්. රංජනි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 42. | එල්.එච්.ඒ.පී.එම්. දයාරත්න මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 43. | ආර්.ඩබ්.ජී. හිරන්ත රාජසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 44. | එම්.එන්.එම්. උසාමා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 45. | ඩබ්.එස්. සඳරුවන් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 46. | ආර්.ඒ. විජේසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 47. | කේ.ඩී.එම්.කේ. දිලේකා කප්පාගොඩ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 48. | එච්.එම්.එස්. චරිතා ජයසිංහ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 49. | එච්.ඩී.එන්.එස්. හෙට්ටිකංකානම මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 50. | එම්. රත්නායක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 51. | ජී.ඩී.සී.පී. ගුණරත්න මයා | රියදුරු |
| 52. | ඩී.එම්. අජිත් සිසිර කුමාර මයා | රියදුරු |
| 53. | ඩී. උපාලි මයා | රියදුරු |
| 54. | බී.ඒ. සුනිල් ජයරත්න මයා | රියදුරු |
| 55. | ඒ.ඩබ්.එම්. අබේරත්න මයා | රියදුරු |
| 56. | ඒ.ජී. රංජිත් කුමාර මයා | රියදුරු |
| 57. | ජේ.ජී. සරත් කුමාර මයා | රියදුරු |
| 58. | ටී.ජී. ආනන්ද මයා | කාර්යාල කාර්ය සහායක |
| 59. | ඩබ්. නන්දන මයා | කාර්යාල කාර්ය සහායක |
| 60. | පී.ඩබ්.ඒ. නීල් අසංක මයා | කාර්යාල කාර්ය සහායක |
| 61. | ජී. නිමල් මයා | කාර්යාල කාර්ය සහායක |
| 62. | ඊ. සුසන්ත ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක |
| 63. | ඒ.එන්.සී. ද අල්විස් මයා | කාර්යාල කාර්ය සහායක |
| 64. | පී.ඒ. තිලකසිරි මයා | කාර්යාල කාර්ය සහායක |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.2 වයස් කාණ්ඩය අනුව කාර්යමණ්ඩලය වර්ගීකරණය

**වගුව - 5.2 වයස් කාණ්ඩය අනුව කාර්යමණ්ඩලය වර්ගීකරණය - 2015**

| අනු අංකය | වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| 1. | 25 > | 02 | 00 |
| 2. | 26-35 | 12 | 10 |
| 3. | 36-45 | 09 | 10 |
| 4. | 46-50 | 07 | 07 |
| 5. | 51-55 | 00 | 05 |
| 6. | 55 < | 02 | 00 |
| **එකතුව** | | **32** | **32** |

මූලාශ්‍රය **:** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3 ස්ථාන මාරුවීම්

රාජ්‍ය සේවයේ සාමාන්‍ය පරිපාටීන්ට අනුකූලව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 17ක් විය.

**ලේඛනය - 02 2015 වර්ෂයේ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලද දිනය |
|---|---|---|---|
| 1. | කේ.ආර්. උඩුවාවල මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015.01.16 |
| 2. | ඩබ්.එම්.ආර්.පී. වීරසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015.12.22 |
| 3. | එස්.ආර්.ඩබ්.ආර්.පී. සත්කුමාර මයා | අධ්‍යක්ෂ | 2015.01.16 |
| 4. | එම්.කේ. සිතාරා ජයසේන මිය | අධ්‍යක්ෂ | 2015.01.16 |
| 5. | එස්.එන්. අත්තනායක මිය | අධ්‍යක්ෂ | 2015.11.06 |
| 6. | සී.ජී. කන්නන්ගර මයා | සහකාර අධ්‍යක්ෂ | 2015.03.27 |
| 7. | ඒ.ආර්.පී.ඩී. රාජපක්ෂ මිය | පරිපාලන නිලධාරි | 2015.04.30 |
| 8. | ජේ.කේ. සුදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.04.30 |
| 9. | කේ.එම්.එස්. වනිගසේකර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.07.17 |
| 10. | එම්.එච්.එන්. ගීතිකා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.08.10 |
| 11. | ආර්.එම්.අයි.කේ. රත්නායක මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.11.12 |
| 12. | කේ.පී. නදුන් සමීර මයා | කළමනාකරණ සහකාර | 2015.11.16 |
| 13. | කේ.ඒ. සුනෙත් සඳරුවන් මයා | කළමනාකරණ සහකාර | 2015.11.16 |
| 14. | හිරන්ති දීගල මෙනෙවිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2015.10.06 |
| 15. | කේ.පී. සිරිසෝම මයා | රියදුරු | 2015.02.18 |
| 16. | ටී.කේ. ෂාම් නිශාන්ත මයා | රියදුරු | 2015.07.30 |
| 17. | බී.එම්. ආරියතිලක මයා | රියදුරු | 2015.09.25 |

2015 වර්ෂය තුළ ස්ථාන මාරුවීම් ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව 18 කි. මොවුන් අතරින් දෙදෙනකු නවක පත්වීම්ලාභීන් වන අතර සෙසු නිලධාරීන් විවිධ රාජ්‍ය ආයතනවල සේවය කර අත්දැකීම් ලද පිරිසක් විය.

**ලේඛනය – 03 2015 වර්ෂය තුළ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 1. | ඩබ්.එම්.ආර්.පී. වීරසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2015.05.18 |
| 2. | එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා | අධ්‍යක්ෂ | 2015.01.19 |
| 3. | එස්.ඒ.එච්. සමරසිංහ මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | 2015.06.22 |
| 4. | පී.එල්.එම්. චතුරංග මයා | සහකාර අධ්‍යක්ෂ | 2015.10.14 |
| 5. | එම්.ඒ.එස්. මධුශංක මයා | සහකාර අධ්‍යක්ෂ | 2015.11.24 |
| 6. | කේ.ඩී.අයි.එස්.කේ. සිරිවර්ධන මිය | ගණකාධිකාරි | 2015.12.30 |
| 7. | පී.කේ. සරත්චන්ද්‍ර මයා | පරිපාලන නිලධාරි | 2015.06.22 |
| 8. | කේ.ඒ. සුනෙත් සඳරුවන් මයා | කළමනාකරණ සහකාර | 2015.02.23 |
| 9. | කේ.පී. නදුන් සමීර මයා | කළමනාකරණ සහකාර | 2015.02.23 |
| 10. | කේ.එම්.එස්. වනිගසේකර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.05.12 |
| 11. | අයි.කේ.ඒ.පී. කිත්සිරි මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.07.16 |
| 12. | ආර්.එම්.අයි.කේ.රත්නායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.09.09 |
| 13. | එච්.ඩී.එන්.එස්. හෙට්ටිකංකානම මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.10.12 |
| 14. | එච්.එම්.එස්. චරිතා ජයසිංහ මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.10.13 |
| 15. | එම්. රත්නායක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2015.10.30 |
| 16. | ජේ.ජී. සරත් කුමාර මයා | රියදුරු | 2015.11.06 |
| 17. | බී.එම්. ආරියතිලක මයා | රියදුරු | 2015.04.01 |
| 18. | ඒ.ඩබ්.එම්. අබේරත්න මයා | රියදුරු | 2015.08.05 |

## 5.4 පුහුණු වැඩසටහන්

### 5.4.1 දේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්ගතව පැවැත්වීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කරන ලදී. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අවශ්‍යතා මෙන්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන් ද මෙම වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබීය. ඒ අනුව 2015 වර්ෂය තුළ ලබා දුන් පුහුණුවීම් 5.3 වගුව මගින් දක්වා ඇත.

වගුව - 5.3 **දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම - 2015**

| අනු අංකය | ක්ෂේත්‍රය | පුහුණු ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | රාජ්‍ය ලේඛන පරිපාලන සහ ලේඛනාරක්ෂක නීතිය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 01 |
| 2. | සරප්/මුදල් අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම් | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 3. | ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන් පිළිබඳව පුහුණුව | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් | 01 |
| 4. | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ පුහුණු පාඨමාලාව | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 04 |
| 5. | රාජ්‍ය පරිපාලන ව්‍යුහය පුහුණු පාඨමාලාව | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 6. | පරිගණක දෘඩාංග පාඨමාලාව | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 25 |
| 7. | කළමනාකාරීත්ව වැඩසටහන් – 2015 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 10 |
| 8. | සේවානියුක්තිය අරමුණු කරගත් ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 |
| 9. | තොරතුරු තාක්ෂණයට අදාළ භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම් පිළිබඳ වැඩමුළුව | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 01 |
| 10. | ගෝලීය යටිතල පහසුකම් ආයෝජනය, ගෝලීය ප්‍රතිසාධන පිළිබඳ වීන ප්‍රසිද්ධ දේශනය | බැංකු කටයුතු අධ්‍යයන ආයතනය | 01 |
| 11. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය නිලධාරීන් සඳහා වන අභියෝග | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 12. | ව්‍යාපෘති තත්ත්ව උසස් කිරීම පිළිබඳ සැකසීම සහ ඇගයීම පිළිබඳ පුහුණු පාඨමාලාව | මිලෝදා ආයතනය | 01 |

## 5.4.2 විදේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ට විදේශීය පුහුණු අවස්ථා ලබා දෙමින් ඔවුන්ගේ අත්දැකීම් හා විෂය දැනුම වර්ධනය කිරීමට 2015 වර්ෂය තුළදී ද කටයුතු කරන ලදී. ඒ අනුව නිලධාරීන් 12 දෙනෙකුට විදේශීය පුහුණු අවස්ථාවන් හිමි විය.

ලේඛනය - 04 විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම - 2015

| අනු අංකය | නම | තනතුර | ලද පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 1. | ඩබ්.එම්.ආර්.පී. වීරසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.08.29 - 2015.09.07 |
| 2. | ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය | අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.08.29 - 2015.09.07 |
| 3. | එස්.එන්. අත්තනායක මිය | අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.08.29 - 2015.09.07 |
| 4. | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.08.29 - 2015.09.07 |
| 5. | ඩබ්.ඩී. සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.08.29 - 2015.09.07 |
| 6. | ඩී.එච්.එස්. පුල්ලපෙරුම මිය | අධ්‍යක්ෂ | සංවර්ධනය වන රටවල් සඳහා රජයේ මානව සම්පත් කළමනාකරණය | චීනය | 2015.09.09 - 2015.09.30 |
| 7. | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 8. | එස්.එච්.ඩී. කළුතන්ත්‍රී මිය | අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 9. | එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා | අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 10. | එම්.ඩී. අබේගුණවර්ධන මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 11. | ඩබ්.එච්.ජී.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 12. | එස්.ඒ.එච්. සමරසිංහ මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 13. | එස්.එම්.එම්.ඩී. සමරවීර මයා | පර්යේෂණ සහකාර | විධායක නිලධාරීන් සඳහා වන විදේශ පුහුණුව | මැලේසියාව | 2015.09.12 - 2015.09.22 |
| 14. | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | රාජ්‍ය පරිපාලනය සඳහා වන කටාර් - කලාපීය පුහුණු මධ්‍යස්ථානයේ "රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ පාඨමාලාව" | කටාර් | 2015.10.12 - 2015.10.15 |
| 15. | එම්.ඩී. අබේගුණවර්ධන මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | ආසියාතික රටවල සිවිල් සේවය සඳහා රාජ්‍ය පරිපාලන සමුළුව | චීනය | 2015.10.12 - 2015.10.31 |
| 16. | එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා | අධ්‍යක්ෂ | ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ජාතික රාජ්‍ය පරිපාලනය | ජපානය | 2015.10.24 - 2015.11.14 |
| 17. | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් | රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සඳහා වූ ප්‍රතිපත්ති සහ නායකත්ව පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කලාපීය අධ්‍යයන චාරිකාව | ඕස්ට්‍රේලියාව | 2015.11.27 - 2015.12.07 |

## 5.5 වාර්ෂික තැපෑල

මෙම දෙපාර්තමේන්තුවට 2015 වසරේ ලැබුණු ලිපි සංඛ්‍යාව 6801ක් විය. මෙම ලිපි විවිධ විෂයයන්ට අදාළ වූ අතර තනතුරු ඇති කර ගැනීම, පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ඉල්ලීම්, විවිධ දීමනා සඳහා වූ ඉල්ලීම්, පැහැදිලි කරගැනීම් හා සාමාන්‍ය පරිපාලනය යන විෂයයන් ප්‍රධාන තැනක් ගෙන තිබුණි.

**වගුව - 5.4** **2015 වර්ෂය තුළ ලැබුණු ලිපි සංඛ්‍යාව**

| අනු අංකය | මාසය | ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජනවාරි | 449 |
| 2. | පෙබරවාරි | 496 |
| 3. | මාර්තු | 683 |
| 4. | අප්‍රේල් | 505 |
| 5. | මැයි | 487 |
| 6. | ජූනි | 612 |
| 7. | ජූලි | 647 |
| 8. | අගෝස්තු | 543 |
| 9. | සැප්තැම්බර් | 587 |
| 10. | ඔක්තෝබර් | 594 |
| 11. | නොවැම්බර් | 584 |
| 12. | දෙසැම්බර් | 614 |
| **එකතුව** | | **6801** |

# 6. මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන යටතේ 2015 වර්ෂය සඳහා මානව සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 242 වැය ශීර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. 48,400,000.00ක් වූ අතර සත්‍ය වියදම රු.46,447,317.74ක් විය. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට අනූහයක් (96%) දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රගතිය පහත 6.1 වගුව මගින් දැක්වේ.

**වගුව - 6.1** **මූල්‍ය ප්‍රගතිය 2014 - 2015**

| වැය විස්තරය | | 2014 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ප්‍රතිපාදනය (අවුරු තබන ලද ප්‍රතිපාදන හැර) (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය ( %) | අනුමත ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය (%) |
| **පුනරාවර්තන වියදම්** | | **36,720,000.00** | **33,818,293.66** | **92** | **44,325,000.00** | **43,105,549.01** | **97** |
| **පුද්ගල පඩිනඩි** | | **26,925,000.00** | **25,295,515.72** | **94** | **34,075,000.00** | **33,824,612.89** | **99** |
| 1001 | වැටුප් හා වේතන | 17,000,000.00 | 15,386,291.45 | 91 | 15,500,000.00 | 15,421,634.77 | 99 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 900,000.00 | 885,202.44 | 98 | 700,000.00 | 556,738.47 | 80 |
| 1003 | වෙනත් දීමනා | 9,025,000.00 | 9,024,021.83 | 100 | 17,875,000.00 | 17,846,239.65 | 100 |
| **ගමන් වියදම්** | | **600,000.00** | **455,548.08** | **76** | **405,000.00** | **233,920.75** | **58** |
| 1101 | දේශීය | 150,000.00 | 108,062.50 | 72 | 200,000.00 | 125,987.50 | 63 |
| 1102 | විදේශීය | 450,000.00 | 347,485.58 | 77 | 205,000.00 | 107,933.25 | 53 |
| **සැපයීම්** | | **4,660,000.00** | **4,211,755.06** | **90** | **3,935,000.00** | **3,582,476.84** | **91** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,950,000.00 | 1,852,595.22 | 95 | 1,525,000.00 | 1,447,766.03 | 95 |
| 1202 | ඉන්ධන | 2,500,000.00 | 2,186,813.54 | 87 | 2,090,000.00 | 1,906,585.87 | 91 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 170,000.00 | 158,386.30 | 93 | 200,000.00 | 108,955.82 | 54 |
| 1205 | වෙනත් | 40,000.00 | 13,960.00 | 35 | 120,000.00 | 119,169.12 | 99 |
| **නඩත්තු වියදම්** | | **1,200,000.00** | **779,398.28** | **65** | **1,900,000.00** | **1,771,757.06** | **93** |
| 1301 | වාහන | 900,000.00 | 675,959.64 | 75 | 1,600,000.00 | 1,552,516.82 | 97 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | 103,438.64 | 34 | 300,000.00 | 219,240.24 | 73 |
| **සේවා** | | **2,535,000.00** | **2,307,054.49** | **91** | **3,110,000.00** | **2,877,714.31** | **93** |
| 1401 | ප්‍රවාහන | 775,000.00 | 630,044.51 | 81 | 800,000.00 | 720,000.00 | 90 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,160,000.00 | 1,148,646.90 | 99 | 1,610,000.00 | 1,609,187.41 | 100 |
| 1405 | වෙනත් | 600,000.00 | 528,363.08 | 88 | 700,000.00 | 548,526.90 | 78 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **මාරු කිරීම්** | | **800,000.00** | **769,022.03** | **96** | **900,000.00** | **815,067.16** | **91** |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 800,000.00 | 769,022.03 | 96 | 900,000.00 | 815,067.16 | 91 |
| **මූලධන වියදම්** | | **2,100,000.00** | **1,462,961.38** | **70** | **4,075,000.00** | **3,341,768.73** | **82** |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම** | | **1,100,000.00** | **654,971.38** | **60** | **900,000.00** | **220,241.00** | **24** |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000.00 | 24,854.50 | 12 | 200,000.00 | - | - |
| 2003 | වාහන | 900,000.00 | 630,116.88 | 70 | 700,000.00 | 220,241.00 | 31 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | **600,000.00** | **582,125.00** | **97** | **1,225,000.00** | **1,185,549.90** | **97** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 600,000.00 | 582,125.00 | 97 | 1,225,000.00 | 1,185,549.90 | 97 |
| **හැකියා වර්ධනය** | | **400,000.00** | **225,865.00** | **56** | **1,950,000.00** | **1,935,977.83** | **99** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 400,000.00 | 225,865.00 | 56 | 1,950,000.00 | 1,935,977.83 | 99 |
| **මුළු එකතුව** | | **38,820,000.00** | **35,281,255.04** | **99** | **48,400,000.00** | **46,447,317.74** | **96** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

